# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1546 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 05/10/2024 පැය 2000

**මාධ්‍ය නිවේදනය**

**නව කල්කුඩා පොලිස් ස්ථානය ජනතා අයිතියට - පොලිස් මූලස්ථානය.**

2024.10.05 වන අද දින මඩකලපුව කොට්ඨාසයේ කල්කුඩා පොලිස් ස්ථාන නව ගොඩනැගිලි සංකීර්ණය වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් සුභ මොහොතින් විවෘත කරන ලදී.

ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිව විවිධ දුෂ්කරතාවයන් සහ අභියෝග මධ්‍යයේ සංචාරකයින්ට මෙන්ම ප්‍රදේශවාසීන්ට ඉමහත් සේවාවක් ඉටුකරමින් පවත්වාගෙන යමින් තිබූ කල්කුඩා පොලිස් ස්ථානය මෙතැන් සිට නව මුහුණුවරකින් ඉහල ගුණාත්මකව බවකින් යුත් සේවාවක් සැලසීමට හැකියාව ලැබෙනු ඇත. කොට්ඨාස ප්‍රතිපාදන යටතේ රුපියල් කෝටි 04 කට ආසන්න මුදලක් මෙම ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම සඳහා වැය කරන ලදී.

මෙම අවස්ථාව සඳහා නැගෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා, මඩකලපුව දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් විශාන්ත මහතා, ත්‍රිකුණාමලය දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ධම්මික වීරසේකර මහතා, අම්පාර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති දමයන්ත විජේසිරි මහතා, මඩකලපුව පොලිස් කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අමල් එදිරිමාන්න මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධරයන්, ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම උත්සව අවස්ථාව සනිටුහන් කරමින් වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා වෙත නැගෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා විසින් සමරු ඵලකයන් පිළිගන්වනු ලැබූ අතර, සංකේතාත්මකව වැඩබලන පොලිස්පති තුමා විසින් පොලිස් ස්ථාන භූමියේ රුක් රෝපණයක්ද සිදු කරන ලදී.

**මෙම උත්සව අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**
















OFFICER IN
V.P.N.Room


MEDIA
Capital
NEWS
DAN
NEWS
CBN
ITN
TV




APPRECIATION




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**